# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2165/14 - 2020 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2020.03.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**5 වන සංශෝධනය**

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020 පෙබරවාරි 10 දිනැති අංක 2162/10, 2019 ඔක්තෝබර් 22 දිනැති අංක 2146/22, 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/33 සහ 2016 ජුනි 15 දිනැති අංක 1971/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2014 සැප්තැම්බර් 19 දිනැති අංක 1880/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 පෙබරවාරි මස 28 වැනි දින.

| අනු අංකය | ඡේද අංක | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 01 | 10.3.2 | I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම<br>උසස් කිරීමේ ක්‍රමය -<br>විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට නොවැඩි සංඛ්‍යාවක් පළමු උපලේඛනය අනුව පුරප්පාඩුවට නියමිත ධාරාවට/ධාරාවන්ට අයත් ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඉහත සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කර බලා, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කරනු ලැබේ. |
| 02 | 11.2 | අධ්‍යක්ෂ, දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ, පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර්, ප්‍රධාන කෘෂි විද්‍යාඥ හා ප්‍රධාන කෘෂි විශේෂඥ තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණයක දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් හා II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පටිපාටියකට අනුව සියළු අයදුම්කරුවන් වෙත ලකුණු පිරිනමා, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. |

03 - 719


1A - G 32137 — 20 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*